# පරිසරය සුරකීමේ ගැටළු

බොරැල්ල, ආයුර්වේද ශික්ෂණ රෝහලේ නේවාසික වෛද්‍ය නිලධාරිණී

**වෛද්‍ය පී. වික්‍රමසිංහ**

අනාගත ලෝකයේ මිනිසාගේ ආහාරය කුමක් වේද? මිනිසාට වගා කිරීමට ඉඩක් ලොවෙහි ඉතිරි වේද? යනාදී ප්‍රශ්න අප ඉදිරියේ ඇත. ඒ අතර 2050 දී ලොවේ ගොවිතැන කෙබඳු වේදැයි සොයා බැලීමට ප්‍රථම ඒ වනවිට ලෝකයේ දේශගුණික තත්ත්වය කෙබඳු වේද යන්න සොයා බැලීමට පර්යේෂණ පිරිස් උනන්දුවන බව පොත පතේ සඳහන් වේ. පෘථිවි පෘෂ්ඨය මත දූෂණය අධික වීම නිසා කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩිවන අතර, ගොවිතැන් කිරීම අතිශය අසීරු කටයුත්තක් බවට පත්වන බව එහි පැහැදිලි කර ඇත. ඒ වන විට දැනට ලැබෙන අස්වැන්නෙන් 50% ක් ලබා ගැනීමට නොහැකි බව හෙළි කර ඇත. එය දරුණු අනතුරු හැඟවීමකි. 2050 වන විට පෘථිවියේ කාබන්ඩයොක්සයිඩ් සහ ඕසෝන් ප්‍රමාණය නිසා උෂ්ණත්වය වැඩිවීමෙන් ගොවිතැන් පාලු කිරීමට හා අස්වැන්න අඩු කිරීමට තරම් හේතුවන බැවින් පෘථිවියේ උෂ්ණත්වය පාලනය කිරීමට ඉක්මන් වැඩ පිළිවෙලක් අවශ්‍යව ඇත. එසේ නොවුනහොත් 2050 දී ලෝකයේ ජනගහනයෙන් 2/3 ක් හාමතේ බව අමුතුවෙන් කීමට අවශ්‍ය නැත.

අද ශීඝ්‍රයෙන් වැනසී යන වනාන්තර සුරැකීමට වහාම පියවර ගත යුතුයි. වනාන්තර වලින් පරිසරයට ඉටුවන සේවාවන් අති විශාලය. ඒවා නම්,

- ඔක්සිජන් වායුව නිපදවීම
- ජලය ගබඩා කිරීම.
- සත්වයින්ට වාසස්ථාන සැපයීම.
- පරිසර දූෂණය පාලනය කිරීම.
- පස සාරවත් කිරීම.
- පසේ තෙතමනය රැකදීම.
- පරිසරයේ සමතුලිත තාවය රැකදීම.
- සිසිල හා සෙවන ලබාදීම.
- පරිසරයේ සුන්දරතාවය රැකදීම යනාදියයි.

වර්ෂා කාලවලදී ඇද හැලෙන වැසිජල බිංදු වනයේ ගස්වල අතුපතර මත වැදීම නිසා ජල බිංදු පොලොවට පතිත වන වේගය අඩුවේ. එබැවින් එකී ජල බිංදු පස මතුපිටින් ගලා ගෙන ගොස් පහසුවෙන් පසට උරාගනී. මෙසේ උරාගන්නා ජලයෙන් පොළොවේ ජල උල්පත් පෝෂණය වේ.

මේ අයුරින් වනාන්තර මගින් මිනිසාටත්, පරිසරයටත්, වටිනා මෙහෙයන් රැසක් ඉටුවේ. වනයට විසිතුරුත්වය හා අලංකාරය ලැබෙන්නේ එහි වෙසෙන පක්ෂීන්ගෙනි. වනයේ වෙසෙන සියලු සතුන් ඔවුන්ගේ පැවැත්මට අවශ්‍ය ආහාර වනයෙන්ම සපයා ගනියි. ස්වභාවයෙන්ම වනය තුළින් වැදගත් කෘත්‍යයක් ඉටුවේ. එනම් වනය තුළ වෙසෙන සත්ව හා ශාඛ විශේෂ අඩුවැඩි නොවන පරිදි පවත්වා ගැනීම එම කෘත්‍යයයි. මෙය ජිවීන්ගේ තුල්‍යතාව හේතු කොට ගෙන වනය තුලින් මතුවන සෞන්දර්යාත්මක වටපිටාවද නොනැසී පවතී. අපගේ අනාගත සුභ සාධනය සහ ජීවනෝපාය ඒ යටතේ රැඳී ඇත.

එසේ වුවද, වනාන්තර වල විනාශය මිනිසාගේ කෘෂිකාර්මික ජීවනයේ ආරම්භයත් සමග ආරම්භ විය. වනාන්තරයේම සත්වයකු සේ ජීවත් වූ ආදී මානවයා පසු කලෙක එතෙක් ගතකල දිවියෙන් ඈත්වී කෘෂිකාර්මික ජීවිතයට හුරු වන්නට විය. තමාට හුරු පුරුදු ආහාර බෝග වගා කිරීමට බිම් ප්‍රමාණයක් වෙන්කර එය එළි පෙහෙලි කිරීමට යුහුසුළු විය. වන බිම නව පාලනයට යටත් කර ගත් ද සිටම මේ දක්වා මිනිසාගෙන් වනාන්තරයටත්, එහි ඇති ශාඛ හා සත්ව සම්පතටත් බලවත් හානි රැසක් සිදුවී තිබේ. ගොඩනැගිලි ඉදිකිරීමට, දුම්රිය මාර්ග තැනීමට, ගෘහ භාණ්ඩ තැනීමට, නොයෙක් දැව වර්ග අපට අවශ්‍ය වේ. අප කියවන ලියන මේ පොත් පත් සඳහා කඩදාසි නිපදවීමට පවා දැව වර්ග යොදා ගැනේ. වනාන්තර ආශ්‍රිතව පෙදෙස්වල වැසියෝ ආහාර පිසීම සඳහා දර භාවිතා කරති. අපට මේ රටේ ඕනෑම තැනක විසීමට අයිතිවාසිකම් ඇතත්, නූතන මිනිසාගේ ක්‍රියාකලාපයන් සමහරක් නිසා අඩු තරමින් වනාන්තර තුළ පවා වන සතුන්ට ජීවත් වීමට ඇති අයිතිය සීමා වී තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් වනය තුළදී වෙඩි පහරට ගොදුරු වී වැනසෙන සතුන් අප්‍රමාණය. ඉවක් බවක් නැතිව වන සතුන් විනාශ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කුරුලු වර්ග රැසක් හා ක්ෂීරපායී වර්ග රැසක් අද ලෝකයෙන් සම්පූර්ණයෙන්ම තුරන් වී ඇත. වනය වන සතුන්ගේ නිවහනක් මෙන්ම ආහාර ගබඩාවක් ද වේ. ගොවිතැන් සඳහා වනාන්තර එළිපෙහෙළි කිරීම නිසා වන සතුන්ට ජීවත් වීමට තිබූ ඉඩ කඩ සීමාවන අතර, ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට ද අවහිරතා ඇතිවේ.

වන සතුන් විසින් වගාබිම් පාළු කිරීම වන සතුන්ගේ අයිතිය යළිත් අත්කර ගැනීමට දරන සාධාරණ වෑයමක් විය නොහැකිද? වන සතුන් දරන මෙම ප්‍රයත්නය ඉදිරියේ මිනිසා ප්‍රබලව නැගී සිටී. එහි ප්‍රතිඵලයක් වී ඇත්තේ මිනිසා අතින් වනසතුන් වැනසී යාමයි. ශ්‍රී ලංකාව රමණීය දිවයිනක් ලෙස පිටරැටියන් පවා පිළිගෙන ඇත්තේ අප රටේ ඇති වනයේ සුන්දරත්වය නිසාය. කලාකරුවාගේ රස සිතුවිලි වලට ජීවය දුන් වනයෙන් මතුවන සුන්දරත්වය මතු පරපුරට දැක ගැනීමට මිනිසා ඉඩ තබයිද?

එද සිරිලකට වැඩි මිහිඳු මා හිමියන් එකල රජකල දේවානම්පියතිස්ස නරිඳුනන්ට මෙසේ පැවසූහ.

"මහරජ ඔබ විසින් සතුන් නොමැරිය යුතුයි. මහරජ ඔබ මෙන්ම ගුවනේ සැරිසරණ පක්ෂීන්ටද, වන සතුන්ටද, මේ පොළොවේ ඕනෑම තැනක හැසිරීමේ සම අයිතියක් ඇත. පොළොව රට වැසියන්ට සහ අනිත් සතුන්ට අයිතිවන අතර ඔබ එහි පාලකයා පමණී."